# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 73 දරන සංස්කෘතික දේපළ පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි.

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

එල්. ඩී.—ඕ. 23/79.

**සංස්කෘතික දේපළ අපනයනය පාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද සංස්කෘතික දේපළ පිළිබඳ ගනුදෙනු කිරීම පිණිස බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත, 1988 අංක 73 දරන සංස්කෘතික දේපළ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

## I වන කොටස

### සංස්කෘතික දේපළ අපනයනය කිරීම

**2.** (1) (මෙහි මින් මතු "පාලක" යනුවෙන් හඳුන්වනු ලබන) අපනයන පාලකවරයා විසින් නිකුත් කරන ලද, නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් මත සහ නියමිත ගාස්තුවක් ගෙවීමෙන් පසුව හැර, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් කිසිම සංස්කෘතික දේපළක් අපනයනය කිරීම හෝ අපනයනය කිරීමට තැත් කිරීම නොකළ යුතු ය. බලපත්‍රයක් මත හැර සංස්කෘතික දේපළ අපනයනය තහනම් කිරීම.

(2) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් සේ බල පැවැත්විය යුතු අතර ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

**3.** (1) 2 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම පාලකවරයා වෙත, නියමිත ආකෘතියෙහි ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම්කරුට ඒ බලපත්‍රය නිකුත් කිරීම ගැන තමාගේ විරුද්ධතාවයක් නොමැති බව ප්‍රකාශිත පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයක් ඉල්ලුම් පත්‍රය සමග විය යුතු ය. සංස්කෘතික දේපළ අපනයන බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර.

(2) බලපත්‍රයක් නිකුත් කිරීම—

(අ) පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති ප්‍රකාශයෙන් ඒ බලපත්‍රය නිකුත් කිරීම ගැන විරුද්ධත්වය පළකර ඇති අවස්ථාවක ; හෝ

(ආ) අපනයන කිරීමට ඉල්ලුම්කරන යම් සංස්කෘතික දේපළක්, ශ්‍රී ලංකාවේ කෞතුකාගාරයකට අවශ්‍ය දේපළක් බව තමාගේ මතය වන අවස්ථාවක

පාලකවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනය.

4. (1) බලපත්‍රයක් නිකුත් කිරීම, පාලකවරයා විසින් 3 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලේකම්වරයා වෙත කරන ලද අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේ දී ඒ අභියාචනය කර ඇත්තේ පාලකවරයාගේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය, ලේකම්වරයා විසින් ස්ථිර කිරීම හෝ ඉවත ලීම කළ හැකි ය.

අවසරයක් නොමැතිව සංස්කෘතික දේපළ අපනයනය කිරීමට දණ්ඩනය.

5. යම් තැනැත්තෙක්, තමාම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් හෝ 2 වන වගන්තිය උල්ලංඝනය කරමින් යම් සංස්කෘතික දේපළක් අපනයනය කළහොත් හෝ අපනයනය කිරීමට තැත් කළහොත්, රේගු ආඥාපනතේ විධිවිධාන යටතේ ඔහු යටත් විය හැකි යම් රාජසන්තක කිරීමකට හෝ දණ්ඩනයකට හෝ හානියකට නොමැතිව, වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් පන්දහසකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකින් ම හෝ දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

පාලකවරයාගේ බලතල සහ කාර්ය පවරාදීම.

6. (1) බලපත්‍ර නිකුත් කිරීමේ බලය පාලකවරයා විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධරයකුට පවරා දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සෑම නිලධරයකුම, තමා වෙත පවරන ලද බලතල පාලකවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කළ යුතු ය.

## II වන කොටස

## සංස්කෘතික දේපළ මණ්ඩලය පිහිටුවීම

සංස්කෘතික දේපළ මණ්ඩලය පිහිටුවීම.

7. (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්කෘතික දේපළ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

8. (1) මණ්ඩලය—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) කෞතුකාගාර අධ්‍යක්ෂවරයා ;

(ඇ) ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂවරයා ;

(ඈ) මධ්‍යම පාරිසරික අධිකාරියේ සභාපතිවරයා ; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, සංස්කෘතික දේපළ පිළිබඳ කාරණා ගැන විශේෂඥ දැනුමක් හා පළපුරුද්දක් ඇති සාමාජිකයන් දෙදෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත් වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්

ඔහු (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සකු නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු නමුත් ඔවුහු නැවත පත්කරනු ලැබීමට සුදුසු වන්නා හ.

(4) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකු, හේතු කිසිවක් නොදක්වා, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කළ හැකි අතර ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලැබූ කවර හෝ සාමාජිකයකු සිය ධුරය හිස් කළහොත් හෝ මීට පෙරාතුව ම වූ උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ඔහු වෙනුවට, ධුරය දැරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නො ගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත්, ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව, පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

9. (1) මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ස්වකීය කාර්ය විධානය විධිමත් කර ගත හැකි ය. මණ්ඩලයේ රැස්වීම් හා ගණපූර්ණය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූර්ණය, මණ්ඩලය අන්‍යාකාර තීරණයක් කළහොත් මිස, සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

මණ්ඩලයේ බලතල.

10. (1) මණ්ඩලය, උපදේශක මණ්ඩලයක් විය යුතු අතර, පුරාවිද්‍යා කොමසාරිස්වරයාට ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා උපදෙස් දීම හෝ මණ්ඩලයේ මතය සඳහා යොමු කරන ලද වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම මණ්ඩලය විසින් කළ යුතු ය.

(2) මණ්ඩලය විසින්, ස්වකීය බලතල ක්‍රියාවේ යෙදවීමේ දී, සංස්කෘතික දේපළ හා සම්බන්ධ කරුණු පිළිබඳව විශේෂඥ දැනීමක් සහ පළපුරුද්දක් ඇති කවර හෝ තැනැත්තකුගේ සේවය ලබාගත හැකි ය.

## III වන කොටස

### සංස්කෘතික දේපළ ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කළ යුතු සංස්කෘතික දේපළ වර්ග අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන බව.

11. අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ උපදෙස් විමසා, සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින්, මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු සංස්කෘතික දේපළ වර්ග කවරේදැ යි, මෙහි පහත දැක්වෙන කරුණු, එනම්—

(අ) ඒ සංස්කෘතික දේපළ වර්ගය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව ;

(ආ) ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය වඩා හොඳින් අගැයීමට හැකි වනු පිණිස ඒ භාණ්ඩ ශ්‍රී ලංකාව ඇතුළත ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව ; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය රැක ගැනීමට ඉවහල් වන හෝ ඉවහල් විය හැකි වෙනත් යම් කරුණු

යථා ලෙස සැලකිල්ලට ගනිමින්, කලින් කල නිශ්චය කොට නියම කළ හැකි ය.

පෞද්ගලික සන්තකයේ ඇති සංස්කෘතික දේපළ ලියාපදිංචි කිරීම.

12. 11 වන වගන්තියේ සඳහන් නිවේදනයේ නිශ්චය කොට නියම කර ඇති යම් සංස්කෘතික දේපළක්, ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඒ සංස්කෘතික දේපළ ලියාපදිංචි කර ඇත්නම් මිස සහ ඒ දේපළ සම්බන්ධයෙන්, ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ නිලධරයා විසින් නිකුත් කර ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින් අයිතිව සිටීම හෝ තමා භාරයේ හෝ සන්තකයේ හෝ තබා ගැනීම නොකළ යුතු ය.

දිසාපතිවරයා ලියාපදිංචි කිරීමේ නිලධරයා විය යුතුය.

13. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින්, 12 වන වගන්තියේ කාර්ය සඳහා, දිසාපතිවරයා, ඔහු පත් කරනු ලැබ ඇති පරිපාලන දිස්ත්‍රික්කය සඳහා, ලියාපදිංචි කිරීමේ නිලධරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය ඉල්ලුම් කිරීම.

14. 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා ඉල්ලුම් කළ යුත්තේ කිනම් කාලසීමාවක් ඇතුළත ද යන්න ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

15. (1) 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතික යක් ලබා ගැනීමට නියමිත සෑම තැනැත්තකු විසින් ම, ඒ සහතිකය සඳහා ඉල්ලුම් පත්‍රයක් තමා පදිංචි පරිපාලන දිස්ත්‍රික්කයේ ලියා පදිංචි කිරීමේ නිලධරයා වෙත, එම කාර්යය සඳහා නියමිත ඉල්ලුම් පත්‍ර ආකෘතියෙහි ඉදිරිපත් කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රදානය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් යෝග්‍ය යැයි ඔහු සලකන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, ලියාපදිංචි කිරීමේ සහතිකයක්, නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත්ව ප්‍රදානය කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ බව එය එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ද සඳහන් කරමින්, ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ඉල්ලුම්කරුට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එය ප්‍රතික්ෂේප කරනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව, ඉල්ලුම්කරු විසින් පුරා විද්‍යා කොමසාරිස්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය.

(5) ලියාපදිංචි කරවා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කෙරෙන පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ තීරණයකින් අතෘප්ත ඉල්ලුම්කරුවකු විසින්, ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

16. 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති යම් සංස්කෘතික දේපළක අයිතිය හෝ භාරය හෝ සන්තකය යම් තැනැත්තකු විසින් පවරනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ පැවරීම සිදු කරනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත ඒ පැවරීම පිළිබඳව, ඔහු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත දැනුම් දිය යුතු ය.

ලියාපදිංචි කළ සංස්කෘතික දේපළක අයිතිය පැවරීම, ලියාපදිංචි කිරීමේ නිලධාරයා වෙත දැන්විය යුතු බව.

17. යම් තැනැත්තකු—

දණ්ඩන.

(අ) යම් සංස්කෘතික දේපළක් අයිතිව තිබියදීත් හෝ ඒ දේපළක භාරය හෝ සන්තකය දරමින් 15 වන වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත්, හෝ

(ආ) යම් සංස්කෘතික දේපළක අයිතිය හෝ භාරය හෝ සන්තකය පවරා දී 16 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඒ පැවරීම දැනුම් දීම පැහැර හැරියහොත්,

ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

## IV වන කොටස

### සංස්කෘතික දේපළ පිළිබඳ ගනුදෙනු කිරීමේ බලපත්‍රය

සංස්කෘතික දේපළ පිළිබඳ ගනුදෙනු කිරීමේ බලපත්‍රය.

**18.** 19 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින්, තමාම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කිසිම සංස්කෘතික දේපළක් විකිණීමේ හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතු ය.

බලපත්‍ර දීම.

**19.** (1) යම් සංස්කෘතික දේපළක් විකිණීමේ හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා—

(අ) සංස්කෘතික දේපළ වෙළෙඳාම් කටයුතු පිළිබඳව, ඉල්ලුම්කරුට ඇති පළපුරුද්ද ;

(ආ) ව්‍යාපාරය කරගෙන යාමට අපේක්ෂිත නගරය, ගම හෝ ප්‍රදේශය ; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු

සැලකිල්ලට ගැනීමෙන් පසුව, පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින්, යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි වූ යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර නියමිත ගාස්තුව ද ඒ සමග විය යුතු ය ;

(ආ) යෝග්‍ය යැයි තමා සලකන පරීක්ෂණයක් කිරීමෙන් පසුව, පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින්, බලපත්‍ර ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් නිකුත් කළ හැකි ය ; නැතහොත් එය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය ;

(ඇ) ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් නිකුත් කිරීම පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ බව ඔහු විසින් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය ;

(ඈ) (1) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි වූ යම් ව්‍යාපාරයක් කරගෙන යාමට බලය දෙන සෑම බලපත්‍රයක් ම නියමිත ආකෘතියෙහි ද නියමිත කාලසීමාවක් සඳහා ද විය යුතු අතර, එය ඒ බලපත්‍රය මගින් බලය දෙන ලද ව්‍යාපාරය මේ පනතේ විධිවිධාන පිළිපදිමින් කරගෙන යන බවට වගබලාගැනීම පිණිස අවශ්‍ය විය හැකි නියමයන් හා කොන්දේසිවලට යටත් විය යුතු ය ;

(ඉ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයකට අදාළ යම් කොන්දේසියක් බලපත්‍රලාභියා විසින් කඩ කළ හොත් හෝ ඒ කොන්දේසියක් අනුව කටයුතු කිරීම පැහැර හැරිය හොත්, පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින් ඒ බලපත්‍රය අවලංගු කළ හැකි ය ;

(ඊ) පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින්, (ඉ) වන ඡේදය යටතේ බලපත්‍රය අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ අවලංගු කිරීම පිළිබඳ දැන්වීමක්, බලපත්‍රලාභියාට නිකුත් කිරීමට සැලැස්විය යුතු ය;

(උ) බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කෙරෙන, පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍ර ඉල්ලුම්කරුවකු විසින් හෝ බලපත්‍රයක් අවලංගු කෙරෙන පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍රලාභියකු විසින් හෝ ඒ තීරණයේ දින සිට දවස් තිහක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව ලේකම්වරයා වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් කළ හැකි ය.

20. 18 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, 19 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ස්වකීය බලපත්‍රය අවලංගු කරනු ලැබූ බලපත්‍රලාභියකු විසින්, ඒ අවලංගු කිරීමේ දිනයට පෙරාතුව තමාගේ අයිතියෙහි, භාරයෙහි සහ සන්තකයෙහි තිබුණු සියලුම සංස්කෘතික දේපළ පිළිබඳව ලියවිල්ලකින් වූ ප්‍රකාශයක්, නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත සහ නියම කරනු ලැබිය හැකි ආකෘතියෙහි සහ ආකාරයට පුරා විද්‍යා කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, ඒ සංස්කෘතික දේපළ 19 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන වෙනත් යම් තැනැත්තකුට විකිණිය හැකි ය: බලපත්‍ර අවලංගු කරනු ලැබූ තැනැත්තන් විසින් බලපත්‍රලාභී වෙනත් තැනැත්තන්ට සංස්කෘතික දේපළ විකිණිය හැකි බව.

එසේ වුව ද බලපත්‍රය අවලංගු කරනු ලැබීමෙන් හය මසක කාලයකට පසුව, එවැනි කිසිම සංස්කෘතික දේපළක් විකිණීම නොකළ යුතු ය.

21. (අ) තමාම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, 18 වන වගන්තිය කඩ කරමින්, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට, යම් සංස්කෘතික දේපළක් විකුණන හෝ විකිණීමට තැත් කරන, හෝ මේ පනතේ 18, 19 සහ 20 වන වගන්ති කඩ කරන තැනැත්තන්ගේ වැරදි.

(ආ) 19 වන වගන්තියේ හෝ 20 වන වගන්තියේ විධිවිධාන කඩ කරන

කවර හෝ තැනැත්තකු, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

## V වන කොටස

### පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ බලතල සහ කාර්ය

පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ බලතල.

22. පුරා විද්‍යා කොමසාරිස්වරයාට—

(අ) 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවශ්‍ය සංස්කෘතික දේපළ ගණ්වල ලැයිස්තුවක් පිළියෙල කිරීමටත්;

(ආ) ලියාපදිංචි කිරීම අවශ්‍ය සංස්කෘතික දේපළ සංරක්ෂණය කිරීමට, නඩත්තු කිරීමට, අලුත්වැඩියා කිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමටත්;

(ඇ) ලියාපදිංචි කිරීම අවශ්‍ය සංස්කෘතික දේපළ ලියාපදිංචි කිරීම, විකිණීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ පාලනය සහ පරිපාලනය කිරීමටත්;

(ඈ) තත්කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කර දෙනු ලැබිය හැකි අරමුදලින්, වටිනා සංස්කෘතික දේපළ මිලට ගැනීමටත්

මෙයින් බලය දෙනු ලැබේ.

පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ කාර්ය.

23. මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක් මගින් හෝ පැවරී ඇති සියලු කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම පුරා විද්‍යා කොමසාරිස්වරයා විසින් කළ යුතු ය.

සංස්කෘතික දේපළ පරීක්ෂා කිරීමේ බලය.

24. (1) පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් හෝ සංස්කෘතික දේපළ පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ සියලු යුක්ති සහගත වේලාවන්හිදී, කවර හෝ තැනැත්තකු සන්තකයේ ඇති කවර හෝ සංස්කෘතික දේපළක් පරීක්ෂා කළ හැකි අතර, පුරාවිද්‍යා කොමසාරිස්වරයාට හෝ එකී නිලධරයාට එවැනි පරීක්ෂාවකට ඉඩ දීමත්, ඒ සංස්කෘතික දේපළ විමර්ශනය කිරීම සඳහා සහ එය චිත්‍රගත කිරීම, ඡායාරූපගත කිරීම හෝ අච්චු සෑදීමෙන් නැතහොත් වෙනත් අන් දමකින් එහි ප්‍රතිනිෂ්පාදනයක් සෑදීම සඳහා අවශ්‍ය සියලු යුක්තිසහගත පහසුකම් සැලසීමත් එවැනි සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු ය:

එසේ වුව ද ඒ කිසිම චිත්‍රයක්, ඡායාරූපයක් හෝ ප්‍රතිනිෂ්පාදනයක්, ඒ සංස්කෘතික දේපළෙහි සන්තකය දරන තැනැත්තාගේ කැමැත්ත නොමැතිව විකිණීම නොකළ යුතු ය;

එසේම තවදුරටත්, අච්චු සෑදීමේදී, ඒ සංස්කෘතික දේපළෙහි සන්තකය දරන තැනැත්තාගේ පූර්ව එකඟත්වය ලබා ගත යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින කවර හෝ තැනැත්තෙක් වරදකට වරදකරුවන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබුවහොත්, රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ විධාන.

25. (1) කවර හෝ තැනැත්තකුට අයිතිව තිබෙන හෝ යම් තැනැත්තකු භාරයේ නැතහොත් සන්තකයේ තිබෙන, ජාතික වැදගත්කමකින් යුත් යම් සංස්කෘතික දේපළක් විනාශ වී යාමේ, විකෘතිවීමේ, ඉන් අනිසි ප්‍රයෝජන ගැනීමේ හෝ අනිසි දිරාපත් වීමට ඉඩ හැරීමේ අන්තරාවට මුහුණපා ඇති බව හෝ එහි ප්‍රකෘති ස්වභාවය වෙනස් කිරීමට ආසන්නව ඇති බව හෝ වෙනස් කරමින් පවතින බව හෝ වෙනස් කර ඇති බව පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ සංස්කෘතික දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා, එහි අයිතිකරුට හෝ එහි භාරය හෝ සන්තකය දරන තැනැත්තාට විධාන දිය යුතු ය.

(2) සංස්කෘතික දේපළෙහි අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා යුක්ති සහගත කාලසීමාවක් ඇතුළත එම විධාන අනුව කටයුතු කිරීමට අපොහොසත් බව හෝ ඒ උපදෙස් අනුව කටයුතු නොකරනු ඇති බව හෝ ඒ සංස්කෘතික දේපළ බලපත්‍රයක් රහිතව ශ්‍රී ලංකාවෙන් ඉවත් කරනු ලැබිය හැකි බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ දේපළ තමාගේ භාරයට ගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයාට ඔහුගේ කාර්ය කිරීමෙහිදී හිතාමතාම අවහිර කරන කවර හෝ තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත්, රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(4) කොමසාරිස්වරයා විසින් යම් සංස්කෘතික දේපළක් (2) වන උපවගන්තිය යටතේ තම භාරයට ගැනීමෙන් පසුව, ඒ දේපළෙහි අයිතිකරු හෝ එහි භාරය හෝ සන්තකය දරන තැනැත්තා ඒ වන විට කොමසාරිස්වරයාගේ විධානය අනුව කටයුතු කිරීමට දත් හැකි තත්ත්වයක සිටින බවට හෝ ඒ විධාන අනුව කටයුතු කර ඇති බවට සහ ඒ දේපළ විනාශ වී යාමේ, විකෘති වීමේ, ඉන් අනිසි ප්‍රයෝජන ගැනීමේ හෝ දිරාපත් වීමට ඉඩ හැරීමේ අන්තරාවක් නොමැති බවට සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ දේපළ එකී අයිතිකරුට හෝ තැනැත්තාට ආපසු දිය හැකි ය.

(5) (2) වන උපවගන්තිය යටතේ භාරයට ගන්නා ලද යම් දේපළක්, කෞතුකාගාරයකදී මහජන ප්‍රදර්ශනයකට තැබීම සඳහා පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින්, කෞතුකාගාර අධ්‍යක්ෂවරයාට භාර දිය හැකි ය.

පුරාවිද්‍යා කොමසාරිස් වරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමට දිසාපතිවරුන්ට සහ වෙනත් නිලධරයන්ට බලය දීම.

26. මේ පනත යටතේ පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරෙන් යමක් ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටු කිරීම—

(අ) යම් දිස්ත්‍රික්කයක් ඇතුළත, ඒ දිස්ත්‍රික්කයේ දිසාපති වරයා විසින් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ කවර හෝ ප්‍රදේශයකදී, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්

කරනු ලැබීම සඳහා, කොමසාරිස්වරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලය දිය හැකි ය.

## VI වන කොටස

## පොදු විධිවිධාන

නිලධරයන්ගේ ආරක්ෂාව.

27. මේ පනත යටතේ පත් කරනු ලැබූ කිසි නිලධරයකු විසින් මේ පනත යටතේ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

නියෝග.

28. (1) මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට බලය දී ඇත්තේ හෝ නියමිතව ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව නියම කරනු ලබන පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනට පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

29. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පුරාවස්තු" යන්නට ශ්‍රී ලංකාවෙහි පිහිටා තිබෙන්නා වූ හෝ තිබී සොයා ගනු ලබන්නා වූ ද අවුරුදු සියයකට අධික කාලයක් පැවතියා වූ ද, පහත දැක්වෙන යම් ද්‍රව්‍ය ඇතුළත් වේ :—

ප්‍රතිමා නෙලනු ලැබූ හෝ සකස් කරනු ලැබූ ගල් හා සියලු වර්ගවලට අයත් කිරිගරුඬ, තඹගුවල මුද්‍රිත චිත්‍ර, කැටයම් කරනු ලැබූ රූප, ශිලා ලේඛන, පින්තාරු කරන ලද චිත්‍ර, ලියවිලි සහ යම් ද්‍රව්‍යයක් මත ඒවා දක්නට ලැබේ

නම් ඒ ද්‍රව්‍යය, පිඟන් ගඩොල් කර්මාන්තය පිළිබඳ වූ කැටයම් ශිල්පය පිළිබඳව වූ ලෝහ විද්‍යාත්මක හා පේෂ කාර්මික කලාව පිළිබඳ වූ ආදර්ශක, කාසි, මැණික් වර්ග, මුද්‍රා, කපා ඔප දැමූ මැණික් වර්ග, රන්, රිදී, මුතු මැණික් ආදියෙන් සෑදූ ආභරණ, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ, යුද්ධායුධ, මෙවලම්, සැරසිලි සහ චංචල දේපළ වන සෙසු සියලු කලාත්මක ද්‍රව්‍ය;

"පුරා විද්‍යා කොමසාරිස්" යන්නෙන් පුරා විද්‍යා කොමසාරිස් ධුරය දැරීමට හෝ පුරා විද්‍යා කොමසාරිස් ලෙස වැඩ බැලීමට පත් කරනු ලැබූ තැනැත්තා අදහස් වන අතර, මේ පනත යටතේ පුරා විද්‍යා කොමසාරිස්වරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් වෙනුවෙන් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"සංස්කෘතික දේපළ" යන්නට ආගමික හෝ ලෞකික හේතු මත, පුරාවිද්‍යාව, ප්‍රාග් ඉතිහාසය, ඉතිහාසය, සාහිත්‍යය, කලාව හෝ විද්‍යාව සඳහා වැදගත් වන්නේ යැයි අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චිතව නම් කොට ඇත්තා වූ ද මෙහි පහත දැක්වෙන ගණ යන්ගෙන් එකකට අයත් වන්නා වූ ද දේපළ ඇතුළත් වේ—

(i) එක්රැස් කළ දුර්ලභ වනසත්ව, වෘක්ෂලතා, ඛනිජ ද්‍රව්‍යවල සහ ඇටසැකිලිවල ආදර්ශක;

(ii) (අ) විද්‍යාවේ සහ තාක්ෂණයේ ඉතිහාසය, යුද්ධ හා සමාජ ඉතිහාසය ඇතුළුව ඉතිහාසයට සම්බන්ධ දේපළ,

(ආ) ජාතික නායකයන්ගේ, චින්තකයන්ගේ, විද්‍යාඥයන්ගේ සහ කලාකරුවන්ගේ ජීවිතයට සම්බන්ධ දේපළ,

(ඇ) ජාතික වැදගත්කමකින් යුත් සිදුවීම්වලට සම්බන්ධ දේපළ,

(iii) පුරා විද්‍යා කැණීම්වලින් හෝ පුරා විද්‍යා ගවේෂණවලින් ලැබුණු වස්තු;

(iv) කැඩී බිඳී ඇති කලාත්මක හෝ ඓතිහාසික ස්මාරකවල හෝ පුරාවිද්‍යාත්මක බිම් වල කොටස්;

(v) අවුරුදු සියයකට වඩා පැරණි ලියවිලි, කාසි මුදල් නෝට්ටු සහ කැටයම් කළ මුද්‍රා ආදී පෞරාණික භාණ්ඩ;

(vi) මානව විද්‍යාත්මක වැදගත්කමක් ඇති භාණ්ඩ;

(vii) අතින්ම පමණක් කරන ලද පින්තූර, චිත්‍ර හා සිතුවම්;

(viii) ප්‍රතිමා කලාවේ හා මූර්තිවල මුල් ලකුණු;

(ix) මුල් කැටයම්, මුද්‍රණ හා අච්චු මුද්‍රණ;

(x) දුර්ලභ අත්පිටපත්, පැරණි පොත්, ලියකියවිලි, චිත්‍ර, සිතියම්, පිඹුරු සහ විශේෂ වැදගත්කමින් යුත් ප්‍රකාශන;

(xi) තැපැල්, ආදායම් හා වෙනත් ඒ හා සමාන මුද්දර;

(xii) පෞරාණික ලේඛන;

(xiii) අවුරුදු සියයකට වඩා පැරණි ගෘහභාණ්ඩ; සහ

(xiv) පැරණි සංගීත භාණ්ඩ.